උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ

5

ඈ මා ඇමතුවේ කලක සිට හඳුනන මගේ මිතුරියක මා අමතන පරිද්දෙනි. මම ඇයට පසෙකින් තිබූ ආසනයේ ඉඳගෙන ඔසරිපට උකුල මත තබා ගතිමි.

"මං ඔයාගෙ වෙඩින් ෆොටෝස් දැකලා තියෙනවා. හරිම ලස්සනයි." ඇය ඉතාම කුළුපගව කීවාය.

සැහැසි පියෙක්දැයි මම උදක්ම කල්පනා කළෙමි.

බැම්මෙන් මිදීමට මගක් හෝ නිශ්චිත ඉලක්කයක් නොමැතිව සිටි මම මගේ ඇඳුම් මලු කිහිපය රැගෙන අපේ මහගෙදරට පැමිණියෙමි. සසංක නොමැති මොහොතක ගැටඹේ වලව්වෙන් නික්මෙන්නට මම සැලසුම් කළේ මන්දැයි යන කාරණය අදටත් මට අපහැදිලිය. සියළු ඇඳුම්

ඉනු කඳුලු පොඟවන්නට මගේ කපු කමිස කර මදි විය. හිතට හරියන අන්දමේ රන් මාලයක් සොයා ගත නොහැකි වූ තැන අපි දෙදෙනා අසල වූ කුඩා අවන්හලක නිදහසේ වාඩි වී දෙළුම් යුෂ තොල ගාමින් සිටියදී මගේ හිතේ ඇඳී තිබූ මෝස්තරය මම කඩදාසියක සිතුවම් කළෙමි. පසුව අස්ගිරිය කිට්ටුව ජීවත් වූ රනකරුවකු ලවා සසංක මා වෙනුවෙන් නිමැවූ මාලය මට අහිමි වී තිබුණි.

කිසිවකු විසින් සොරා ගෙන තිබුණේ රන් මාලය පමණක් නොව මගේ අතීතයට අයත් මිහිරියාව ය.ඒත් යමක් මට අහිමි වන්නට නියමිත නම් මා ඒ වෙනුවෙන් හඬා වැලපී පලක් වේද? මගේ ඇඳුම් සහ පොත් පත් සියල්ල කුලී රියට පටවා අනතුරුව අවසන් වරට මා ගැටඹේ වලව්ව තුලට ඇතුළු වූයේ තලතා අමතා මා නික්ම යන බව දැනුම් දීමටය. සසංකගේ මව වාතහංග පත්‍ර වලින් ගොටුවක් තනා ඒ තුලට කතුරු මුරුංගා දළු පුරවමින් ජනේලයෙන් එපිට බලාගෙන සිටියාය.ඇය සිහින්ව පලා ලියන්නට එම උපක්‍රමය භාවිතා කරනු මම මීට පෙරද දැක තිබුණි. මම හිස් මනසින් ඈ

වූවාය

.

"මං මොනව කරාටද එයාට.පුතාගෙ හපංකං අම්මත් දන්නව ඇතිනෙ.අප්ප වගේම නැතෑ මහලොකු පුතණ්ඩියත්" මම පෙරළා උත්තර බඳින්නට තරම් දිරිමත් වුනෙමි.

ගැටඹේ මැණිකෙගේ දෑසින් පිටවන ගින්දර දකින්නට මදකුදු පමා නොවූ මම වලව් වත්තෙන් පිටව ආවේ නැවත කිසි දිනක ඒ වහල යටට පා නොතබන බවට මා තුලම ගොඩ නගා ගත් තදබල විශ්වාසයෙනි

000000000000000

මනහාරී වෙනුවෙන් ගෙත්තම් කරමින් සිටි උණුසුම් කබාය උකුල මත තිබියදීම, යළි ගොඩ නොගන්නට සිතා මිහිදන් කළ අතීතය තුලට රිංගාගත් මගේ දුබල සිත මටත් නොදැනීම කඳුලු කන්දක් මගේ දෑසින් වගුරවා තිබුණි. අතීතයේ දවසක මගේ මිතුරියක විසින් විශ්වවිද්‍යාල සඟරාවකට ලියූ කවියක තිබූ දෙපදයක් මට හදිසියෙන් සිහි විය.

## ගඟක් තරමට හඬමි..... හඬනු නොයුතුම පෙමකට...

"මාව දන්නෙ කොහොමද" මම සෘජු හඬින් ඇසුවෙමි.

මන්දයත් ඒ වන විටත් මගේ කුතුහලය උපරිමයක් දක්වා ඇවිලී තිබුණු බැවිනි. ඇගේ කථා විලාශය තුල සැඟවී තිබූ පහසුවෙන් හඳුනා ගත හැකි වෛරය සහ වේදනාව යන ලක්ෂණ සියල්ල විසින් මා තුල ඇති කළ බලවත් පීඩාව ඈ කෙ-රෙන් යට කී පැනය ඇසීමට මා තුල පෙලඹීමක් ඇති කලා නොවේ දැයි මට දැන් සිතේ. නමුත් පෙර කී දිනයේ එබඳු හැඟීම් කිසිවක් පිළිවෙලකට ගොනුකර ගැනීමට තරම් අවශ්‍ය කරන මානසික ඒකාග්‍රතාවයක් මා තුල නොතිබූ බව ඔබට උවමනාවෙන් කිව යුතු නැතැයි මම විශ්-වාස කරමි. ගැහැණියක විසින් අත් නොවිඳිය යුතුම අවාසනාවන්ත අත්දැකීම් පෙලකට මම මුහුණ දෙමින් සිටියෙමි.

"මම සසංකගේ ඉස්කෝලෙ යන කාලෙ ඉඳන් ගර්ල් ෆ්‍රෙන්ඩ්.....ඔයයි සසංකයි බඳින කොට අපේ දරුවට අවුරුද්දක්වත් පිරිලා තිබුණෙ නැහැ"

"අපේ දරුව කිව්වෙ"

"මගෙයි සසංකගෙයි දරුවා"

චත්‍රා විසින් මවෙත එල්ල කරන ලද්දේ හී පහරක්ද,හෙන පහරක්ද නැතහොත් බෝම්බයක්දැයි නිශ්චිතව නිර්වචනය කළ නොහැකි වුවත් එය මා තුල තියුණු කම්පනයක් ඇති කළ අධි යථාර්තයක් බවට පත් වී තිබුණි. සසංකගෙන් ලද කුරිරු දඬුවම හමුවේ හදවත ගල්කරගෙන සිටි ඒ සොඳුරු ගැහැණිය ත් මාත් පොදු කුලකයක ට අයත් වූවන් හෙයින් අනිසි ගැටුම් ඇති කොට ගෙන සිත් පාරා ගෙන පලක් නැතැයි මගේ ඇතුළු හදවත මට මුරගාන්නට විය. ඇය මටවත් මා ඇයටවත් වරදක් කර නැත. අප තිදෙනා විසින්ම දැන හෝ නොදැන වරද්දා තිබුණේ අර අහිංසක දරුවාටය. එකම සිදුවීම නැවත නැවතත් සිදුවීම වලක්වා ලන්නට දෛවය උත්සාහ දරා නොතිබුණේ අතිශය අකාරුණික අන්දමිනි. සසංක විසින් ඇතුලාන්තයෙන් අති මහත් ලෙස පීඩා විඳින සිය උත්පත්ති කථාවම සිය දරු-වාටත් උරුම කර දුන් ඔහු කෙතරම්

පිළිවෙලට අසුරා මගේ අහරණ සහිත ලී මංජුසාව විවර කර බැලූ විට පෝරුව මතදී සසංක විසින් මගේ ගෙල බැඳි රන් මාලය එතුල නොවූ මම මට වහා හඳුනා ගත හැකි විය. මම වමතේ පැලඳ සිටි මගේ මංගල මුදුව සීරුවෙන් ඇඟිල්ලෙන් මුදා



ගෙන මගේ අහරණ මංජුසාව ඉවත් කිරීමෙන් හිස් වූ ඉඩ මත තැන්පත් කළෙමි. ලොකු කඳුලු ගුලි දෙකක් කම්මුල් තෙමාගෙන ගලා අවුත් ඉපැරණි අල්මාරියේ ලී තට්ටුව මතට වැටී අතුරුදන් විය.ඒ ලී තට්ටුව අතීතයේදී තවත් අසරණ ගැහැණුන්ගේ කඳුලින් නැහැවී ඇතුවා නොවේදැයි මට හදිසියෙන් සිහිපත් විය. මම දෙකම්මුල් කමිස කරෙන් පිසදා ගතිමි. සසංක සමඟින් රන් බඩු සාප්පු වල ඇවිද මගේ හිතට ගැලපෙන සරල මෝස්තරයක් සහිත රන් මාලයක් සෙවූ ඉමිහිරි අතීතය සිහිවී දෑසට

දෙස බලා සිටියෙමි.

"මං යන්න කියලා තලතා"

"යහපතක්ම වෙන්න ඕනෙ නෝනෙට"

ඇය දෑසට ඉනු කඳුල චීත්ත පොටෙන් පිස දැමුවාය. මම ඇය වැලඳ ගත්තෙමි. ඒ අහිංසක ගැමි ගැහැණිය මා වෙනුවෙන් ඉකිබින්දාය.

"බලං හිටපල්ලකො යහපතක්ම වෙන හැටි!!! මගේ කොල්ලට කරල යන අප-රාදෙට....."

ගැටඹේ මැණිකේ වියරුවෙන් කෑගසන්නට

"ගඟක් තරමට හඬමි.....
හඬනු නොයුතුම පෙමකට..."

එය මගේ ජීවිතයට මෙතරම් අදාල වේ යැයි එකල මම සිහිනෙනුදු නොසිතුවෙමි. එහෙත් මටත් නොදැනෙන කිසියම් දෛවෝපගත කරුණක් නිසා හඬනු නොයුතුම පෙමක් වෙනුවෙන් මම ගඟක් තරමට හැඬුවෙම් නොවෙම්ද? එය කෙතරම් දුරට බුද්ධිගෝචර කාරණයක්ද යන්න සිතා බැලිය හැකි මානසික මට්ටමක මම දැන් පසුවෙමි. මන්දයත් කෙතරම් වේදනාබර කාරණයක් වුවද කාලයාගේ ඇවෑමෙන් එහි ගැඹුර අඩුවන බැවිනි. මාද අත්විඳ තිබුණේ එම